රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | PUB.ADM/SEC/07 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2020.04. 06 |

සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**කොරෝනා වෛරස ව්‍යාප්තිය හේතුවෙන් සහන සැලසීම සඳහා අනෙකුත් රාජ්‍ය ආයතනවල කාර්යමණ්ඩල ලබා ගැනීම**

කොරෝනා වෛරසය නිසා අපහසුතාවට පත්ව ඇති ජනතාව වෙත සහන සැලසීම සඳහා විවිධ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් අත්‍යාවශ්‍ය රාජකාරි ඉටුකරමින් සිටී.

02. ඇඳිරි නීති හා අනෙකුත් සීමාවන් නිසා රජයේ නිලධාරීන්ගේ නිත්‍ය සේවා ස්ථානවල රාජකාරි සීමාවී ඇති නිසාත් බොහෝ නිලධාරීන් තම සේවය ඕනෑ ම අත්‍යාවශ්‍ය ආයතනයක් වෙත ලබා දීමට මේ අවස්ථාවේ සූදානම්ව සිටින නිසාත් අවශ්‍ය ඕනෑ ම නිලධාරියෙකු අත්‍යාවශ්‍ය සේවා සඳහා තාවකාලිකව අනුයුක්ත කර ගැනීමට අනුමැතිය මෙයින් ලබා දෙමි.

02. ඒ අනුව එසේ හඳුනා ගන්නා නිලධාරියෙකු කිසියම් අමාත්‍යාංශයක/ දෙපාර්තමේන්තුවක අත්‍යාවශ්‍ය සේවා සඳහා සහායට ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් එම නිලධාරීන් තාවකාලිකව අනුයුක්ත කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. එසේ අනුයුක්ත කරන ලද නිලධාරීන්ගේ ලැයිස්තුවක් මා වෙත යථා කාලයේ දී එවීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වා සිටින අතර ඒ සඳහා වන විධිමත් තාවකාලික අනුයුක්ත කිරීමේ අනුමැතිය, පසුව ලබා දීමට අවශ්‍ය කටයුතු මවිසින් සිදු කරනු ලැබේ.

03. එසේ තාවකාලිකව අනුයුක්ත කරන නිලධාරීන්ගේ වැටුප එම නිලධාරීන්ගේ ස්ථිර සේවා ස්ථානයෙන් ගෙවීමට කටයුතු කළ යුතු අතර ඉටුකරන සේවාව සඳහා වන විශේෂ දීමනා ඇත්නම් එම දීමනා තාවකාලිකව අනුයුක්ත කරන ලද සේවා ස්ථානයෙන් ගෙවීමට කටයුතු කළ යුතු බව ද සැලකුව මැනවි.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
ලිපිනය / முகவரி / Address: නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. / சுதந்திர சதுக்கம் கொழும்பு 07 இலங்கை / Independence Square, Colombo 07, Sri Lanka
වෙබ් අඩවිය/ இணையத்தளம் / Website : www.pubad.gov.lk